ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade: 06 | විෂයය Subject: බුද්ධ ධර්මය | පත්‍රය Paper: I,II | කාලය Time: පැය 02 |

නම :- ..........................................................................................   පංතිය :- ...........................

සැලකිය යුතුයි :-

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න**

## <u>I කොටස</u>

අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සිදුහත් බෝසතාණන් වහන්සේ මව් කුස පිළිසිඳ ගත්තේ,

I. වෙසක් පොහෝ දිනකය.
II. පොසොන් පොහෝ දිනකය.
III. ඇසළ පොහෝ දිනකය.
IV. වප් පොහෝ දිනකය.

02. සිදුහත් කුමරුගේ මව වූයේ,

I. යශෝදරා දේවියයි.
II. මහමායා දේවියයි.
III. මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි.
IV. කිසාගෝතමී දේවියයි.

03.සුද්ධෝදන රජතුමාගේ ගුරුවරයා වූයේ,

I. සර්වමිත්‍ර බමුණාය.
II. භග්ගව තවුසාය.
III. අසිත තාපසතුමාය.
IV. කොණ්ඩඤ්ඤ තවුසාය.

04. වප් මගුල් දින සිදුහත් කුමරු වැඩූ භාවනාව වූයේ,

I. මෛත්‍රී භාවනාවයි.
II. ආනාපානසති භාවනාවයි.
III. විදර්ශනා භාවනාවයි.
IV. බුද්ධානුස්සති භාවනාවයි.

05. යසෝදරා දේවියගේ පියා වූයේ,

I. සුද්ධෝදන රජතුමාය.
II. සුදස්සන රජතුමාය.
III. සුප්‍රබුද්ධ රජතුමාය.
IV. අමිත රජතුමාය.

- අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල (අ) කොටසට වඩාත් ගැලපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා යා කරන්න.

| (අ) | (ආ) |
|---|---|
| 06) උපතිස්ස | ඇසළ පොහෝ දින |
| 07) සිවුරු පිරිකර | සොත්ථිය බමුණා |
| 08)ගිහිගෙය හැර යාම | සැරියුත් මහරහතන් වහන්සේ |
| 09) කුස තණ මිටි අට | පස්වග තවුසන් |
| 10) බරණැස ඉසිපතනය | ඝටිකාර බමුණා |

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (√) ලකුණ ද, වැරදි නම්(×) ලකුණ ද, ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.

11) රජගහ නුවර රජකම් කළේ බිම්බිසාර රජතුමාය. (   )

12)බෝසතාණන් වහන්සේ බුදු වීමට පෙර දින සිහින පහක් දුටු සේක. (   )

13) සිදුහත් කුමරු ඒකාන්තයෙන් ම බුදු වන බව පවසා සිනාසුණේ අසිත තවුසා ය. (   )

14) සිදුහත් බෝසත් කුමරු පැවිදි වූයේ නේරංජනා ගං තෙරදීය. (   )

15) සිදුහත් කුමරුගේ සන්සුන් බව දැක නිබ්බුත පද කීවේ සුජාතා දේවියයි. (   )

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර වරහන තුලින් තෝරා ලියන්න.

16) මහාමායා දේවියගේ නැගෙණිය..............................................දේවියයි.

(යසෝදරා / භද්දකච්චායනා / මහා ප්‍රජාපති ගෝතමී )

17) සුද්ධෝදන රජු තම පුතුට දෙවන වැඳීම සිදු කළේ.......................................උත්සවයේදීය.

(නම් තැබීමේ / වප් මගුල් / විවාහ )

18) ගිහිගෙය හැරයාම ........................................ නමින් ද හැඳින්වේ.

( දුෂ්කර ක්‍රියාව/ මහාභිනිෂ්ක්‍රමනය / මධ්‍යම ප්‍රතිපදාව)

19) සිදුහත් බෝසතුන්ට මනුලොව උපදින්නට ආරාධනා කළේ.............................මහා බ්‍රහ්මයාය.

( සංජය /සහම්පති/ සුමන )

20) බුදුරජාණන් වහන්සේ අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රයේ දී හොඳ නරක පැහැදිලි කිරීමට උදාහරණයට ගත්තේ ...............................(කලයක්/කැඩපතක්/ මුදල්)

(ලකුණු 2x20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01) කෙටි පිළිතුරු සපයන්න.

1. සිදුහත් කුමරු ඒකාන්තයෙන් ම බුදුවන බව ප්‍රකාශ කළ දෙදෙනා කවුරුන් ද?
2. සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවා ද?
3. චතුර හා කෑම සඳහා වන ශාසනික වචන 02 ලියන්න.
4. රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 02 ලියන්න .
5. සිදුහත් කුමාර චරිතයෙන් ගත හැකි ආදර්ශ 02 ලියන්න.
6. ශිෂ්‍යයෙකු හා ශිෂ්‍යාවන් හිඳ ගැනීමේ භාවනා ඉරියව් 02 වෙන වෙනම නම් කරන්න.
7. කුමාරෝත්පත්තිය සමඟ සිදු වූ අසිරිමත් සිදුවීම් 02 ක් ලියන්න.
8. සිදුහත් බෝසතාණන්ට කිරිපිඩු දානය පූජා කළේ කවුද?
9. සිදුහත් බෝසතාණන් වහන්සේ සත්‍යය සොයා යන විට හමු වූ ගුරුවරු දෙදෙනෙක් නම් කරන්න.
10. පහත දැක්වෙන ගාථාව සම්පූර්ණ කරන්න.

    වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේසු පතිට්ඨිතං

    ........................................................................................

(ලකුණු 2 x 10 = 20)

02) 1. මෛත්‍රිය යන්නෙහි අදහස ලියන්න. (ලකුණු 02)

2. මෛත්‍රී භාවනාවේ දී තමාට මෛත්‍රී කරන ආකාරය ලියන්න. (ලකුණු 03)

3. මෛත්‍රී භාවනාව තුළින් ලැබෙන අනුසස් 11කි ඉන් 05 ක් නම් කරන්න. (ලකුණු 05)

03) 1. විහාරස්ථානයට ගොස් සිදු කරන වතාවත් 02 ක් ලියන්න. (ලකුණු 02)

2. විහාරස්ථානයේදී අප වන්දනා කරන ස්ථාන පළමු, දෙවන, තෙවන ලෙෂ පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 03)

3. පන්සිල් ලියා දක්වන්න. (ලකුණු 05)

04) 1. දියුණුවේ දොරටු ඇතුළත් ජාතක කතාවේ නම කුමක්ද? (ලකුණු 02)

2. දියුණු වීමේ දොරටු සය නම් කරන්න (ලකුණු 03)

3. දියුණුවට බාධා කරන කරුණු 03 නම් කරන්න. (ලකුණු 05)

05) 1. නිබ්බුත පද ලියා දක්වන්න. (ලකුණු 05)

2. පස්වග තවුසන් නම් කරන්න. (ලකුණු 05)

06) 1. සිදුහත් කුමරුට ගිහිගෙය කළකිරීමට මුල් වූ කරුණු 02 ක් ලියන්න. (ලකුණු 02)

2. ත්‍රිවිද්‍යාව නම් කරන්න. (ලකුණු 03)

3. මහාමායා දේවිය දුටු සිහිනය ලියා දක්වන්න. (ලකුණු 05)